# ස්මාට් මනී

## ස්ථාවර තැන්පතුවෙන් ලද හැකි මූල්‍ය නිදහස භුක්ති විඳින්න

## ස්මාට් මනී අයදුම්පත

ස්මාට් මනී සමග ලැබෙන මූල්‍යමය නිදහස භුක්ති විඳින්න. ස්මාර් මනී සමග ඔබේ කෙටි කාලීන මුදල් ප්‍රවාහය පිළිබඳව කනස්සල්ලට පත් නොවී, පවතින ස්ථාවර තැන්පතුවෙහි මුල් මුදලෙහි වටිනාකම ඉහළයන ආකාරයට දිගු කාලීනව ආයෝජනය කළ හැකිය. මේ හරහා, 100%ක් සම්පූර්ණ ස්ථාවර තැන්පතුව සඳහා ඉහළ පොළී අනුපාතිකයක් ලබාගන්නා අතර, ඔබේ එම ස්ථාවර තැන්පතුව ඇපයට තබා, 90% දක්වා අයිරාවක් හෝ ණය පහසුකමක් ලබාගැනීමේ හැකියාව ඔබට ලැබේ.

**ස්මාට් මනී හි මූලික ප්‍රතිලාභ සහ ලක්ෂණ:**

### ස්මාට් මනී සුරක්ෂිත අයිරා

- ආපසු ගෙවීමේ අවම මාසික වාරිකයක් නොමැත.
- ඔබ භාවිත කළ මුදල පමණක් ගෙවන්න, ඔබට අවශ්‍ය වන මුදල පමණක් ණය වශයෙන් ලබා ගෙන, මුළු බැර ශේෂයට නොව, ඔබ ලබාගත් ණය සඳහා පමණක් පොළී ගෙවන්න. ඔබගේ බැර ශේෂයෙන් කිසිදු මුදලක් ලබා නොගන්නේ නම්, කිසිදු පොළියක් අය කෙරෙන්නේ ද නැත.
- ඔබේ ස්ථාවර තැන්පතුවෙහි වටිනාකමින් 90%ක් දක්වා ණය සීමාවක් ඔබට ලබාගත හැකිය.
- අදාළ පොළී අනුපාතිකය විචල්‍ය පොළී අනුපාතිකයකි. වෙළඳපොළ පවතින පොළී අනුපාතිකයට අනුව කලින් කලට වෙනස්වීම්වලට විෂය වන විචල්‍ය පොළී අනුපාතිකයන් බැංකුව විසින් තීරණය කරනු ඇත.

**ස්මාට් මනී සුරැකුම් ණය**

- නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රමය : අඩුවන ශේෂය මත හෝ සමාන වාරිකවලින් හෝ ආපසු ගෙවීමේ විකල්පයක් තෝරාගැනීමේ හැකියාව ඔබට ඇත. වසර 05ක් දක්වා ආපසු ගෙවීමේ කාලසීමාව තෝරාගැනීමේ නම්‍යශීලී විකල්පයක් ඔබ සතු ය.

- ඔබේ ස්ථාවර තැන්පතුවෙහි වටිනාකමින් 90%ක් දක්වා ණයක් ඔබට ලබාගත හැකිය.*

- රු.2,500/-ක අවම ගාස්තුවකට හෝ රු.25,000/-ක උපරිම ගාස්තුවකට යටත්ව, පියවන ලද හිඟ වටිනාකමින් 1%ක (ඒ අතරින් වැඩි අගයක් සහිත මුදල) ගාස්තුවක් යටතේ කොටසක් පියවීම හෝ නියමිත කාලයට පියවීම සිදු කරන්න.

- අදාළ පොළී අනුපාතිකය විචල්‍ය පොළී අනුපාතිකයකි. වෙළඳපොළ පවතින පොළී අනුපාතිකයට අනුව කලින් කලට වෙනස්වීම්වලට විෂය වන විචල්‍ය පොළී අනුපාතිකයන් බැංකුව විසින් තීරණය කරනු ඇත.

## මාගේ අවශ්‍යතාව

ස්මාට් මනී සුරක්ෂිත අයිරාවකි

ස්මාට් මනී සුරක්ෂිත ණය මුදලකි

පවත්නා ස්මාට් මනී පහසුකමක් නවීකරණයකි

## පුද්ගලික තොරතුරු (තනි අයදුම්කරු) (ණය ගැණුම්කරු)

□ මයා □ මිය □ මෙනෙවිය □ වෙනත් (කරුණාකර සඳහන් කරන්න)

සම්පූර්ණ නම:

ජාතික හැඳුනුම්පත් අංකය ( ජා.හැ.ප) /ගමන් බලපත්‍ර අංකය :

නිකුත් කළ දිනය: අවලංගුවන දිනය:

පාරිභෝගික අංකය:

ගිණුම් අංකය:

ජාතිකත්වය:

පදිංචි රට:

වීසා බලපත් තොරතුරු (විජාතිකයන් සඳහා අදාළ වේ)

වීසා බලපත් අංකය:

වීසා බලපත් වර්ගය: අවලංගුවන දිනය :

වත්මන් පදිංචි ලිපිනය:

ස්ථිර ලිපිනය:

වත්මන් ලිපිනයේ ඔබේ පදිංචිය අවු. 03 ට වඩා වැඩි ද? (සුදුසු කොටුව සලකුණු කරන්න.)

☐ ඔව් ☐ නැත, නැත නම්, කරුණාකර පෙර ලිපිනය සඳහන් කරන්න.

ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයකු/ව්‍යාපාර හවුල්කරුවකු/ව්‍යාපාර සහකරුවකු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තනතුරක් (රාජ්‍ය, අධිකරණ, පොලිසිය හෝ හමුදාමය) දරයි නම්? ඔව් ☐ නැත ☐

ඔව් නම්, කරුණාකර සබඳතාවයෙහි ස්වභාවය පැහැදිළි කරන්න.

නැවත ගෙවීම් සිදුකරන ආකාරය (සුදුසු කොටුව සලකුණු කරන්න.)

☐ රැකියාවෙන් ලැබෙන මුදලින් ☐ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභයෙන්

☐ ලොතරැයි දිනුම් / තෑගි මුදල්

☐ ආයෝජනවලින් ලැබෙන මුදල් / ආයෝජන කල්පිරීමෙන්

☐ දේපළක් විකිණීමෙන් (උදා- කාරය) ☐ උරුමයෙන් ☐ පුද්ගලික ඉතුරුම්

☐ වෙනත්

නිවසේ දුරකථන අංකය: ජංගම :
විද්‍යුත් තැපැල් :

HSBC අධ්‍යක්ෂවරයකු හෝ සේවකයකු වන ඔබගේ සමීපතම පවුලේ සාමාජිකයකු හෝ ඥාතියකු සිටීද? ☐ ඔව් ☐ නැත

සේවකයාගේ නම:........................................

## පුද්ගලික තොරතුරු (බද්ධ අයදුම්කරු) (ණය ගැණුම්කරු)

☐ මයා ☐ මිය ☐ මෙනෙවිය ☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න)
සම්පූර්ණ නම:
ජාතික හැඳුනුම්පත් අංකය ( ජා.හැ.ප) /ගමන් බලපත්‍ර අංකය :
නිකුත් කළ දිනය: අවලංගුවන දිනය:

පාරිභෝගික අංකයඃ

ගිණුම් අංකයඃ

ජාතිකත්වයඃ

පදිංචි රටඃ

වීසා බලපත් තොරතුරු (විජාතිකයන් සඳහා අදාළ වේ)

වීසා බලපත් අංකයඃ

වීසා බලපත් වර්ගයඃ අවලංගුවන දිනය ඃ

වත්මන් පදිංචි ලිපිනයඃ

ස්ථිර ලිපිනයඃ

වත්මන් ලිපිනයේ ඔබේ පදිංචිය අවු. 03 ට වඩා වැඩි ද? (සුදුසු කොටුව සලකුණු කරන්න.)

☐ ඔව් ☐ නැත, නැත නම්, කරුණාකර පෙර ලිපිනය සඳහන් කරන්න.

ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයකු/ව්‍යාපාර හවුල්කරුවකු/ව්‍යාපාර සහකරුවකු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තනතුරක් (රාජ්‍ය, අධිකරණ, පොලිසිය හෝ හමුදාමය) දරයි නම්?* ඔව් ☐ නැත ☐

ඔව් නම්, කරුණාකර සබඳතාවයෙහි ස්වභාවය පැහැදිළි කරන්න*.

නැවත ගෙවීම් සිදුකරන ආකාරය (සුදුසු කොටුව සලකුණු කරන්න.)

☐ රැකියාවෙන් ලැබෙන මුදලින් ☐ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභයෙන්

☐ ලොතරැයි දිනුම් / තෑගි මුදල්

☐ ආයෝජනවලින් ලැබෙන මුදල් / ආයෝජන කල්පිරීමෙන්

☐ දේපළක් විකිණීමෙන් (උදා- කාරය) ☐ උරුමයෙන් ☐ පුද්ගලික ඉතුරුම්

☐ වෙනත්

නිවසේ දුරකථන අංකයඃ ජංගම ඃ

විද්‍යුත් තැපැල් ඃ

HSBC අධ්‍යක්ෂවරයකු හෝ සේවකයකු වන ඔබගේ සමීපතම පවුලේ සාමාජිකයකු හෝ ඥාතියකු සිටීද? ☐ ඔව් ☐ නැත

සේවකයාගේ නම:......................................

**අයිරා පහසුකම් සඳහා පමණි (කරුණාකර අදාළ තැන් සලකුණු කරන්න)**

නව ජංගම ගිණුමක් විවෘත කිරීමට මම කැමැත්තෙමි (HSBC ජංගම ගිණුමක් දැනට නොමැති ගනුදෙනුකරුවන් සඳහා ය). ☐

පහත දැක්වෙන ජංගම ගිණුම මාගේ ස්මාර්ට් මනී අයිරා ගිණුම වශයෙන් භාවිත කිරීමට කැමැත්තෙමි (ස්මාර්ට් මනී අයිරා/ජංගම ගිණුම් සහිත වර්තමාන ගනුදෙනුකරුවන් සඳහා ය).* ☐

ගිණුම් අංකයඃ ..............................

*ශ්‍රී ලංකාවේ නේවාසික පදිංචි තත්ත්වය අවසන් කෙරෙමින් ඔබගේ නේවාසික වීසා බලපත්‍රය කල් ඉකුත් ව හෝ වෙනත් රටකට සංක්‍රමණය වන අවස්ථාවක දී, පිළිවෙලින් ඔබගේ නේවාසික වීසා බලපත්‍රය කල් ඉකුත්වන දිනයේ දී හෝ ශ්‍රී ලංකාවේ ඔබේ නේවාසික තත්ත්වය වෙනස්වන දිනයේ දී (මින් මතුවට "දිනය" යනුවෙන් හැඳින්වේ) මෙම අයිරා පහසුකම අවලංගු වේ. දිනයට හෝ ඊට පෙර හිඟ මුදල පියවීමට ඔබ අපොහොසත් වුවහොත්, ඔබේ ස්ථාවර තැන්පතු(ව), බැර ශේෂයන්, හි කොටසක් හෝ සම්පූර්ණයෙන් හෝ බැංකුව විසින් ලබාගනු/හර කෙරනු ඇති අතර, ඔබට පූර්ව දැනුම්දීමකින් තොරව බැංකුවේ පූර්ණ අභිමතය පරිදි පහසුකම අවලංගු කරනු ඇත.

**අයිරාව අයදුම්කිරීමේ හේතුව**

☐ වාහනයක් මිළ දී ගැනීම
☐ අධ්‍යාපනය
☐ විවාහ මංගල්‍යය
☐ සංචාරය/නිවාඩු ගතකිරීම
☐ නිවස අලුත්වැඩියාව
☐ ණය ඒකාබද්ධ කිරීම/ප්‍රතිමූල්‍යකරණය
☐ පාරිභෝගික භාණ්ඩ
☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න)

## අවශ්‍ය මුදල

පහත සඳහන්, 'ඇපය පිළිබඳ තොරතුරු' කොටස යටතේ දක්වා ඇති කාල තැන්පතු ගිණුමට එරෙහිව, ශ්‍රීලංරු හෝ (කරුණාකර ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න)

.................................................................................................

(ඉලක්කමින්) ..............................ක සුරක්ෂිත ණය පහසුකමක් සඳහා අයදුම් කිරීමට කැමැත්තෙමි.

### ණය පහසුකම් සඳහා පමණි (කරුණාකර අදාළ තැන් සලකුණු කරන්න)

ණය ආපසු ගෙවීමේ කාලසීමාව* (කරුණාකර අදාළ තැන් සලකුණු කරන්න)

☐ මාස 12 ☐ මාස 24 ☐ මාස 36 ☐ මාස 48 ☐ මාස 60

☐ වෙනත්

*ඔබ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින විජාතිකයෙකු නම්, ණය ආපසු ගෙවීමේ කාලසීමාව නේවාසික වීසා බලපත්‍රය අවලංගුවන දිනය නොඉක්මවිය යුතු වේ.

**ණය අයදුම් කිරීමේ අරමුණ**

☐ වාහනයක් මිළ දී ගැනීම ☐ අධ්‍යාපනය ☐ විවාහ මංගල්‍යය

☐ සංචාරය/නිවාඩු ගතකිරීම ☐ නිවස අලුත්වැඩියාව ☐ ඒ මත නැවත ලබාදෙන (Top-up)

☐ ණය ඒකාබද්ධ කිරීම/ප්‍රතිමූල්‍යකරණය ☐ පාරිභෝගික භාණ්ඩ

☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න)

ආපසු ගෙවීමේ ක්‍රමවේදය: ☐ සමාන මාසික වාරික ☐ අඩුවන ශේෂයට

ණය මුදල බැර කල යුත්තේ:

මාගේ/අපගේ ණය ආපසු ගෙවීමේ ගිණුමට

මාගේ/අපගේ පවත්නා HSBC ගිණුමට (ගිණුම් අංකය):

මාගේ ආපසු ගෙවීමේ මාසික මුදල, පහත ගිණුමෙන් මාසිකව හර කරන්න:

මාගේ/අපගේ පවත්නා HSBC ගිණුමට (ගිණුම් අංකය):

HSBC සමඟ නව ගිණුමක් විවෘත කල යුතු ය. HSBC සමඟ ණය ආපසු ගෙවීමේ නව ගිණුමක් විවෘත කිරීම සඳහා ඔබ අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ කරුණාකර අප සමඟ සාකච්ඡා කරන්න.

## ඇපය පිළිබඳ තොරතුරු

ඔබ විසින් ඇපයට තැබීමට අදහස් කරන කාල තැන්පතුව/විදේශ ව්‍යවහාර මුදල් කාල තැන්පතුව පිළිබඳ තොරතුරු. බද්ධ තැන්පතු ඇපයට තැබීමට ඔබ අදහස් කරන්නේ නම්, බද්ධ තැන්පතු හිමියා සම-ණය ගැනුම්කරුවකු විය යුතු බවත්, පහසුකම, බද්ධ පහසුකමක් වනු ඇති බවත් කරුණාවෙන් සලකන්න.

ඔබ විසින් සිදු කරනු ලබන්නේ ඔබගේ පවත්නා පහසුකම ඉහළ නැංවීම/නවීකරණය කිරීම පමණක් වුවද, ඔබ විසින් ඇපයට තබනු ලබන සියලුම කාල තැන්පතු කරුණාකර සඳහන් කරන්න.

| **ගිණුම් අංකය** | **සඳහන් නම (නම්) (බද්ධ නම්, කරුණාකර සඳහන් කරන්න** | **මුදල (කරුණාකර ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න)** |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | **එකතුව** | |

## හැසිරවීමේ ගාස්තු

| | |
|---|---|
| HSBC Premier ගනුදෙනුකරුවන්<br><br>HSBC Advance ගනුදෙනුකරුවන්<br><br>අනෙකුත් සියලුම ගනුදෙනුකරුවන් | නොමිලේ<br><br>නොමිලේ<br><br>නොමිලේ |

## ස්මාට් මනී ණය නියමිත කාලයට පෙර/අර්ධ වශයෙන් ගෙවීම (විචල්‍ය)

| |
|---|
| රු.2,500/-ක අවම ගාස්තුවකට හෝ රු.25,000/-ක උපරිම ගාස්තුවකට යටත්ව, පියවන ලද හිඟ වටිනාකමින් 1%ක් (ඒ අතරින් වැඩි අගයක් සහිත මුදල) |

මෙම පහසුකමට අදාළ විශේෂාංග, පිරිවැය සහ අවදානම් මා විසින් සමාලෝචනය කරන ලද අතර, එය මාගේ අවශ්‍යතාවන්ට ගැලපෙන බව තහවුරු කරමි.

මූලික අයදුම්කරුගේ අත්සන

දිදි/මාමා/වවවව

දිනය

හවුල් අයදුම්කරුගේ අත්සන

දිදි/මාමා/වවවව

දිනය

ඉහත ගනුදෙනුකරු/අත්සන්කරු වන ඔහු/ඇය විසින් මෙම අයදුම්පත මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

අත්සන - 01 වන සාක්ෂිකරු

01. සම්පූර්ණ නම:

ලිපිනය:

රැකියාව:

දුරකථන අංකය:

අත්සන - 02 වන සාක්ෂිකරු

02. සම්පූර්ණ නම:

ලිපිනය:

රැකියාව:

දුරකථන අංකය:

## බැංකුවේ භාවිතය සඳහා පමණි

ශාඛාවේ ලේඛන ලැයිස්තුව

අයදුම්පත සම්පූර්ණයි

විශේෂ උපදෙස්

අනන්‍යතාව

ගනුදෙනුකරුගේ වාර්තා

තැන්පතු මැන්ඩේටය

නිත්‍ය නියෝග

තැන්පතු කල්පිරීමේ උපදෙස්

**දැනට පවතින පහසුකම් පිළිබඳ තොරතුරු**

---

නිලධාරියාගේ අත්සන

දත්ත ඇතුළත් කරන ලද්දේ

නම

මුලකුරු

ප්‍රතික්ෂේපිතයි / අනුමතයි

අනුමත/ප්‍රතික්ෂේප කරන ලද්දේ

අත්සන

දිනය

ප්‍රතික්ෂේප කිරීමට හේතුව

## නීතිරීති සහ කොන්දේසි - ස්මාර්ට් මනී

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් (මින් මතුවට 'බැංකුව' යනුවෙනු හැඳින්වෙනු ඇති) විසින් මා / අප ( ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් ලෙස හැඳින්වෙනු ඇති) වෙත මාගේ / අපගේ සමස්ත රුපියල් කාල තැන්පතු ගිණුම(ගිණුම්)වල වටිනාකමින් 90%ක් සහ/හෝ මාගේ / අපගේ විදේශ ව්‍යවහාර මුදල් කාල තැන්පතු ගිණුම (ගිණුම්)වල වටිනාකමින් 90% ක් නොඉක්මවන මුදලක් සඳහා අයිරාවක ආකාරයෙන් හෝ වාරික ණයක ආකාරයෙන් ස්මාට් මනී පහසුකමක් ලබාදීමට සලකා බලනු ලබයි. ("ණය ගැණුම්කරු" යන යෙදුමෙන් සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වන විට ඔහුගේ / ඇයගේ උරුමකරුවන් / උරුමකාරියන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, පොල්මඃකරුවන් සහ නීත්‍යානුකූල නියෝජිතයන් ද අදහස් වන අතර, " ණයකරුවන්" ඒ අනුව අර්ථ ගැන්වේ). ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමගින් පහත සඳහන් අයිරා සහ වාරික ණය (මෙහි මින් මතුවට "පහසුකම/පහසුකම් හෝ ස්මාට් මනී පහසුකම හෝ ණය හෝ අයිරා" යනුවෙන් හැඳින්වෙන) යන දෙකට ම අදාළ වන නීතිරීති සහ කොන්දේසි භාරගෙන ඊට එකඟ ව සිටිති.

01. බැංකුව විසින් පහසුකම ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත ලබා දෙනුයේ, අභ්‍යන්තර ණය තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව සහ බැංකුව විසින් පහසුකම අනුමත කිරීමේ අනතුරුව බවට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් පිළිගනියි.

02. (i) පහසුකම් සඳහා වන පොලිය කලින් කලට වෙළඳපොල පොලී අනුපාතවලට අනුව බැංකුව විසින් තීරණය කරන පරිදි වෙනස්වීමට යටත් වේ.

(ii) පොලිය සහ මූලික මුදල, ව්‍යවස්ථාපිත හිඟ මුදල් ද සමඟ, ඉහතින් නිශ්චිතව දක්වා ඇති ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ජංගම ගිණුමෙන් හර කර, අයකෙරෙනු ඇත. දිනපතා පවතින හිඟ ශේෂය මත ගණනය කළ අනුපාතයට හෝ පහත 4 වගන්තියෙහි දක්වා ඇති ආකාරයට, බැංකුව විසින් යම් අවස්ථාවක දැනුම් දෙනු ඇති වෙනත් යම් අනුපාතයක් මත, ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ නමින්/නම්වලින් ඇති අයිරා වූ ගිණුමක් මත බැංකුව විසින් පොළී අයකළ හැක. බැංකුවට සුපුරුදු ආකාරයට ගණනය කෙරෙන පොළිය සෑම මසක ම හෝ බැංකුව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇති කාලාන්තරවල දී හෝ ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ගිණුමෙන් හර කෙරෙනු ඇත. ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත පිරිනමා ඇති මෙම පහසුකම් හෝ වෙනත් ණය පහසුකම් සම්බන්ධයෙන් හෝ, ලිඛිත නියමයක් මත හෝ එසේ නොවුව ද ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ නියමය මත හෝ ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙනුවෙන් සිදුකරන ලද ඕනෑම ආකාරයක ගනුදෙනුවක් මත ගෙවිය යුතු හෝ දරා ඇති යම් කොමිස් මුදලක්, වියදම් හෝ ගාස්තු බැංකුව වෙත පවතින ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ගිණුමෙන් හර කෙරෙනු ඇත.

(iii) ණය ගැණුම්කරු/ගැණුම්කරුවන්ගේ ජංගම ගිණුමෙන් හර කෙරෙන සියලුම පොලී, කොමිස්, වියදම් හෝ ගාස්තු මුදල් බැංකුව වෙත පවතින ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ වගකීමෙහි කොටසක් වනු ඇති අතර, එම මුදල් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ජංගම ගිණුමෙන් හර කිරීම මඟින් අයිරා සීමාව හෝ බැංකුව විසින් එහි අභිමතය පරිදි නියමකර ඇති වෙනත් යම් සීමාවක් (ඉහත සඳහන්) ඉක්මවීම සිදුවන්නේ නම්, එම අතිරේක මුදල වහාම ආපසු ගෙවීමට ණය ගැණුම්කරු/ගැණුම්කරුවන් භාරගනියි.

(iv) ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ජංගම ගිණුම/ගිණුම්වල පවතින කිසියම් බැර ශේෂයක් සම්බන්ධයෙන්, නිශ්චිත මුදල් හෝ ගිණුම් සම්බන්ධයෙන් කලින් කලට ලිඛිතව එකඟ වනු ඇති ආකාරයකින් හැර, මෙම පහසුකම් පවතින කාලසීමාව තුළ කිසිදු පොලියක් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත ගෙවීමට නොමැත.

(v) HSBC Advance හා HSBC Premier ගනුදෙනුකරුවන් වෙත ස්මාට් මනී පහසුකම යටතේ ලබාදෙන අයිරා සහ වාරික ණය මත බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි තීරණය කරනු ඇති වරණීය පොලී අනුපාත අයකරනු ලැබිය හැකිය.

03. පොලිය, වියදම් හා බැංකුවේ අවශ්‍යතාවලට හා කලින් කලට බලපවත්වනු ඇති ස්ථාවර රෙගුලාසිවලට අනුකූලව අය කෙරෙනු ඇති වෙනත් යම් ගාස්තු ද ඇතුළත්ව සියලු ම හිඟ මුදල් පළමු ඉල්ලීමේ දී ම බැංකුව වෙත ගෙවීමට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් භාරගනියි. බැංකුව වෙත ඇති ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ සියලුම වගකීම් පියවන ලෙස ඉල්ලා සිටීමට ද, එම පියවර සඳහා හේතු දැක්වීමට හෝ සාධාරණීකරණය කිරීමට බැඳී සිටීමකින් තොරව, ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත දින දාහතරක (14) පූර්ව ලිඛිත දැනුම්දීමක් භාරදීම මඟින් සිය අභිමතය පරිදි ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත ලබා දෙන ලද පහසුකම් සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට ද (මෙහි පවතින නීතිරීති හා කොන්දේසි කඩකිරීම සම්බන්ධව හෝ වෙනත් කරුණක් සඳහා) බැංකුවට විකල්පය පවතිනු ඇත. බැංකුව විසින් හෝ එහි කිසියම් නිලධාරියෙකු විසින් පිරිනමා ඇති කිසිදු දීර්ඝකිරීමක්, අයිතීන් අතහැරීමක් හෝ අනුග්‍රහයක් හේතුවෙන් මේ යටතේ බැංකුවට ඇති අයිතීන්ට අගතියක් සිදු නොවනු ඇත. පහසුකම / පහසුකම් ඕනෑම අවස්ථාවක දී සංශෝධනය වීමට යටත් වන අතර, අනාගත හා අභූ වගකීම් මුදලින් ආවරණය කිරීම සඳහා ඉල්ලීමට ඇති අයිතිය ද ඇතුළත්ව කොළඹ දී ඉල්ලූ විට ගෙවීම සඳහා බැංකුවේ අතික්‍රමණ අයිතියට යටත් වනු ඇත.

04. මෙම පහසුකම්වලට අදාළ ව බැංකුව විසින් ණය ගැණුම්කරු/ ගැණුම්කරුවන් වෙත ලබාදීමට අදහස් කරන කිසියම් හිමිකමක්, කැඳවීමක්, උපදෙසක් හෝ දැන්වීමක්, බැංකුව විසින් අවසානයට දැන සිටි, ණය ගැණුම්කරු/ගැණුම්කරුවන් ලිපිනය වෙත තැපෑලෙන් ලිඛිතව ලබා දී ඇත්නම් ණය ගැණුම්කරු/ ගැණුම්කරුවන් වෙත නිසි ලෙස ලබා දී ඇති බවට සැලකේ. පොලී අනුපාත වෙනස්වීම පිළිබඳ නිවේදන, ලිපියක් මඟින්, ගිණුමට අදාළ ප්‍රකාශන පණිවුඩයක් මඟින්, බැංකු පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම මඟින් සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවියේ (www.hsbc.lk) ප්‍රදර්ශනය කිරීම මඟින් ලබාදිය හැකිය.

05. බැංකුව සන්තකයේ සහ පාලනය යටතේ පවතින, ණය ගැණුම්කරුට /ගැණුම්කරුවන්ට අයත් යම් දේපල අයිතිවාසිකම් සහ හෝ සම්බන්ධතා පිළිබඳව බැංකුවට උකස් අයිතියක් සහ හිලව් කිරීමේ අයිතියක් (හෝ ඊට සමාන අයිතියක්) ඇති බවත්, එම අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කළ හැකි බවත්, බැංකුව විසින් කිසිදු දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක දී ගිණුම් පවතින්නේ කුමන තත්ත්වයක් යටතේ වුවද එය නොසලකා ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ නමින් දරන ලද සියලු හෝ යම් ගිණුම් සම්බන්ධ කිරීම හා ඒකාබද්ධ කිරීම කළ හැකි බවත් සහ / හෝ බැංකුවේ කාර්යාලවල ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ ජංගම, ඉතුරුම්, කාල තැන්පතු හෝ වෙනත් ඕනෑම ගිණුමක කවර හෝ ව්‍යවහාර මුදල්වලින් පවතින යම් ගිණුමකින් වැඩිපුර මුදල් ගැනීමකට එරෙහිව එම ගිණුම්

බැංකුව විසින් හිලව් කරනු ලැබිය හැකි බවටත් ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් තවදුරටත් එකඟ වේ.

06. හිඟ මුදල් අයකර ගැනීම සඳහා තුන්වන පාර්ශ්වයක එකතු කිරීමේ නියෝජිතයන් පත්කර ගැනීමට ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් විසින් මෙයින් එකඟවී බැංකුවට අවසර දෙනු ලැබේ. ණය අයකරගැනීම, එකතු කිරීමේ නියෝජිතයෙකුට යොමු කිරීමට හෝ ගෙවීම බලාත්මක කරවාගැනීම සඳහා නෛතික පියවර ගැනීමට සිදුවුවහොත්, එවිට පොලිය, නෛතික වියදම් සහ එකතු කිරීමේ නියෝජිත ගාස්තු ඇතුලුව හිඟ මුදල ලබාගැනීම සඳහා දරන ලද සියලු පිරිවැය ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් විසින් ගෙවනු ලැබිය යුතු ය.

07. අවසරලත් සීමාව ඉක්මවා හිඟව පවතින පහසුකම් සීමා ඉක්මවූ / හිඟ ලෙස සැලකෙනු ඇති අතර, ඒවා බැංකුවේ පවතින දඬුවම් පොලී අනුපාතවලට යටත් වනු ඇත.

08. (i) මෙම අත්තිකාරමෙහි කොන්දේසිය වන්නේ ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් අවසරලත් සීමාව ඉක්මවන්නේ නම් හෝ මාසික ණය වාරිකය පියවීමට අසමත් වන්නේ නම් හෝ, බැංකුව විසින් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ස්ථාවර තැන්පතු, බැර ශේෂයන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ආපසු ලබාගැනීම/හරකිරීම සහ සිය තනි අභිමතය මත ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් පූර්ව දැනුම්දීමකින් තොරව පහසුකම අඩුකිරීම හෝ අවලංගු කිරීම සිදුකරනු ඇත යන්න බවට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් අවබෝධ කරගෙන එකඟ වී සිටියි. එවැනි අවස්ථාවක දී කාල තැන්පතුව ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ උපදෙස් මත කල්පිරීමට පෙර ආපසු ලබාගත්තාක් මෙන් කාල තැන්පතු ගිණුම්වලට අදාළ වන නීතිරීති හා කොන්දේසිවලට අනුව දඬුවම් ගාස්තු අදාළ වනු ඇත.

(ii) හිඟව පවතින සහ ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් බැංකුව වෙත ගෙවිය යුතු මුදල සම්බන්ධව බැංකුවෙහි නිලධාරියෙකු විසින් ලබාදෙන සහතිකයක් හිඟව පවතින සහ ගෙවිය යුතු සත්‍ය මුදල සම්බන්ධයෙන් සියලු ම අරමුණු සඳහා ප්‍රමාණවත් හා අවසානාත්මක සාක්ෂියක් වනු ඇත.

(iii) බැංකුව වෙත ඇති මෙම අධිකාරී බලය අවලංගු කළ නොහැකි බවට ද බැංකුවෙහි කැමැත්ත සහිතව අවලංගු කරන තෙක් පූර්ණ වශයෙන් බලාත්මකව පවතිනු ඇති බවට ද ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමඟින් ප්‍රකාශ කර සිටිති. මීට පටහැනිව යම් ලිඛිත හෝ වෙනත් නීතියක හෝ ගිවිසුමක හෝ මින් අනතුරුව ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් හෝ බැංකුව විසින් හෝ සකස් කළ හෝ සකස් කරනු ඇති ලියැවිල්ලක කිසිවක්

සඳහන්ව තිබුණ ද, ඒ බව නොතකා, ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත පූර්ව දැණුම්දීමක් නොකර සහ හිඟව පවතින මුදල් බැංකුවට ගෙවන ලෙස ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙතින් කිසිදු පූර්ව ඉල්ලා සිටීමක් නොමැතිව බැංකුවට ඕනෑම අවස්ථාවක දී සහ සියලු ම අවස්ථාවල දී අත්පත් කරගැනීමේ අයිතිවාසිකම ක්‍රියාවේ යෙදවීමට බලය හා අවසරය පවතිනු ඇත.

(iv) මේ යටතේ කිසියම් පියවීමේ හෝ ලියමක් හෝ අත්පත් කරගැනීමේ අයිතියක් ක්‍රියාවේ යෙදවීමේ දී හෝ එමඟින් හෝ වෙනත් ආකාරයකින් යම් චෙක්පතක් හෝ මුදල් ගෙවීම සඳහා වන එවැනි වෙනත් ලේඛනයක් හෝ අණකරයක් ගරු කිරීමට බැංකුව විසින් ක්‍රියා කිරීම හෝ උද්දේශිතව ක්‍රියාකිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඊට සම්බන්ධ කළ හැකි ඕනෑම ආකාරයක හෝ ස්වභාවයක අයැදීම්, හානි, පාඩු, පිරිවැය සහ වියදම් සහ ඕනෑම ආකාරයක අගතියකින් බැංකුව හානිපූරණය කිරීමට ද බැංකුවට හානි සිදුවීම වැළැක්වීමට ද ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමඟින් වැඩිදුරටත් භාරගනිති.

09. මෙම පහසුකම් සඳහා උකස් තබා ඇති කාල තැන්පතු කල්පිරීමේ දී හෝ කල්පිරීමට පෙර අර්ධ වශයෙන් ආපසු ලබාගැනීමට බැංකුව විසින් අවසර ලබාදෙනු ඇත්තේ, කාල තැන්පතුවෙහි ඇති ඉතිරි මුදල, අදාළ පරිදි, ජංගම ගිණුමෙහි හෝ ණය ගිණුමෙහි පවතින හිඟ මුදල ආවරණය කිරීමට ප්‍රමාණවත් වන්නේ නම් පමණකි.

10. ණය ගැණුම්කරුගේ හවුල් දේශීය/විදේශ මුදල් කාලීන තැන්පතු, ණය ගැණුම්කරුගේ ජංගම ගිණුමට සම්බන්ධ කෙරෙනු ඇත්තේ බැංකුව වෙත ලබා දී ඇති මැන්ඩේට් පත්‍රයේ ඇති උපදෙස් මඟින් දෙපාර්ශ්වයෙන් ඕනෑම පාර්ශ්වයකට අත්තිකාරමක් (ණය හෝ අයිරාවක්) ඉල්ලා සිටිය හැකි බවට සඳහන් ව ඇත්නම් බවට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් එකඟ වී සිටියි.

11. බැංකුව වෙතින් ලැබෙන ගිණුම් ප්‍රකාශන ප්‍රවේශමෙන් පරීක්ෂා කර බැලීමට ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් භාරගෙන සිටියි. බැංකුවේ වාර්තාවල සඳහන් වන ආකාරයට ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ ලිපිනයට ගිණුම් ප්‍රකාශනයක් යැවීමේ දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත බැංකුව වෙත ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් වෙතින් කිසිදු විරෝධතාවයක් නොලැබුණහොත්, එහි දැක්වෙන ශේෂය නිවැරදි ලෙස සැලකෙනු ඇති අතර, ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් වෙතින් කිසිදු සන්නිවේදනයක් ලැබී නැතැයි යන කරුණ ගිණුමෙහි නිවරද්‍ය භාවය තහවුරු කිරීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, එවැනි ගිණුම් ප්‍රකාශනයක් සම්බන්ධයෙන් ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් විසින් කිසිදු

විරෝධතාවක් නොදැක්විය යුතු ය. කිසියම් කාලසීමාවක් සඳහා ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් වෙත ගිණුම් ප්‍රකාශනයක් ලැබී නොමැති නම්, බැංකුව වෙතින් ප්‍රකාශනයක් ඉල්ලා සිටීම ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ තනි සහ සම්පූර්ණ වගකීමක් බවට ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් පිළිගෙන සිටියි.

12. බැංකුව විසින් යම් අවස්ථාවක දී ඉල්ලා සිටින්නේ නම්, ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් බැංකුව වෙත උකස් සුරක්ෂිතයක් තැබිය යුතු අතර, දැන් හෝ අනාගතයේ දී ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ නමින් පවතිනු ඇති සියලු ම මුදල්, කොටස්, බැඳුම්කර හා වෙනත් වටිනා ලේඛන බැංකුවෙහි නියමය මත බැංකුවෙහි තැන්පත් කරනු ඇත. බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි, ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් විසින් මෙම පහසුකම යටතේ හෝ වෙනත් බැංකු පහසුකමක් යටතේ හෝ පොළී, ගාස්තු හා වියදම් ද ඇතුළත්ව බැංකුව වෙත ණය ව සිටින සමස්ත මුදල පියවීම සඳහා සුරක්ෂිතයක් ලෙස සලකනු ඇත.

13. මේ යටතේ පවතින යම් අයිතියක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමේදී (සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන්) බැංකුව වෙතින් සිදුවන ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් එවැනි අයිතියක් හෝ ප්‍රතිකර්මයක් අතහැරීමක් ලෙස අර්ථනිරූපනය නොකළ යුතුය.

14. පහසුකම ලබා දී ඇත්තේ හෝ අඛණ්ඩව ලබාදෙමින් පවතින්නේ ණය ගැණුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනකට නම්, එවැනි අවස්ථාවක දී ගෙවිය යුතුව පවතින සියලු ම මුදල් සම්බන්ධයෙන් එක් ව හා වෙන් වෙන් ව වගකීමට ඔවුන් භාරගෙන සිටියි.

15. රඳවා ගැනීමක් සිදුකිරීමට ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් වෙත නීතියෙන් බලකිරීමක් පවතින්නේ නම් හැර, ණය ගැණුම්කරු /ගැණුම්කරුවන් විසින් සිදුකරන ගෙවීම් කිසිදු පියවීමක්, හරස් හිමිකම්පෑමක්, රඳවා ගැනීමක් හෝ කිසිදු ආකාරයක කොන්දේසියකින් තොරව ගෙවිය යුතු වන අතර, සත්‍ය වශයෙන් ම බැංකුව වෙත ලැබෙන මුදල, එවැනි රඳවාගැනීමක් නොතිබූයේ නම් ලැබෙන මුදල වන ආකාරයට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් ගෙවිය යුතුව පවතින මුදල ඉහළ දැමිය යුතු වේ.

16. ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත ව නොමැති ඕනෑම ආයතනයකින් සියයට 10 (10%)ක හෝ ඊට වැඩි ප්‍රතිශතයක කොටස් ප්‍රමාණයක් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් තමා සතු කරගත් විටක දී සහ/හෝ අත්පත් කරගත් විටක දී ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් විසින් ඒ පිළිබඳව වහාම ලිඛිතව බැංකුව දැනුවත් කරනු ඇත.

17. මෙම ලේඛනයෙහි දක්වා ඇති සැකසුම් ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙනුවෙන් කාල තැන්පතු හෝ බැංකුව විසින් අවශ්‍ය යැයි සලකන වෙනත් යම් ලේඛනයක් අලුත්කිරීමට, අනුමත කිරීමට හෝ ක්‍රියාවේ යෙදවීමට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමගින් තවදුරටත් ශ්‍රී ලංකාවෙහි බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී හෝ අදාළ කාලයේ දී ඔවුන්ගේ බලය පවරන ලද නාමිකයන් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ඇටෝර්නි බලකරුවන් ලෙස සහ එක් ව හා වෙන් වෙන් ව ඇටෝර්නි බලකරුවන් ලෙස නම්කර සංස්ථාපනය කර පත්කරයි.

18. **ස්මාට් මනී පහසුකම යටතේ වන අයිරා සඳහා පමණක් අදාළ වේ**

(i) කිසියම් ගෙවුම් නියමයකට ගරු කළහොත් එමගින් අවසරලත් සීමාව (සීමාවන්) ඉක්මවා යාමක් සිදුවීමට හැකි නම්, එයට ගරු කිරීමට බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ හැකිය. එවැනි ගෙවුම් නියමයක් ප්‍රතික්ෂේප කර ඇති බව ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත දැනුම්දීමට බැංකුව වෙත කිසිදු බැඳීමක් නොපවතී. බැංකුව විසින් හෝ එහි කිසියම් නිලධාරියෙකු විසින් පිරිනමා ඇති කිසිදු දීර්ඝ කිරීමක්, අයිතීන් අතහැරීමක් හෝ අනුග්‍රහයක් හේතුවෙන් මේ යටතේ බැංකුවට ඇති අයිතීන්ට අගතියක් සිදු නොවනු ඇත. අවසරලත් සීමාව ඉක්මවා ගිය අවස්ථාවක දී යම් අතිරික්තයක් මෙම නීතිරීති හා කොන්දේසිවලට යටත් වන බවට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් පිළිගනිති.

(ii) බැංකුවේ දී ගෙවිය යුතු ලෙස නියම කළ අයිතමයක් ද ඇතුළත්ව, බැංකුව විසින් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ගිණුම(ගිණුම්) වෙත බැර කරන යම් අයිතමයක් සාමාන්‍ය නාලිකා ඔස්සේ නිශ්කාශනයට යටත් වේ. අයිරා පොලිය ගණනය කිරීමේ දී එසේ බැර කරන ලද එම අයිතම නිශ්කාශනය කෙරෙන තෙක්, එම අයිතමවල වටිනාකම බැහැර කිරීමට බැංකුවට අයිතිය පවතී.

(iii) විදේශ ව්‍යවහාර මුදල් කාල තැන්පතුවක් මත පවතින ස්මාට් මනී පහසුකමක් සම්බන්ධයෙන් අදාළ විදේශ ව්‍යවහාර මුදල් වර්ගයේ විනිමය අනුපාත වෙනස්වන සෑම අවස්ථාවක දී ම අයිරා සීමාව වෙනස්වීමට යටත් වන බව ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමගින් එකඟ වෙයි. එසේම, තැන්පතු කල්පිරීමේ දී ගෙවන ලද පොළී ඇත්නම්, ඒවා නැවත ආයෝජනය නිසා තැන්පතුවල වැඩිවීම් සලකා බලා, තැන්පතුවල සෑම කල්පිරීමක දී ම අයිරා සීමාව ස්වයංක්‍රීයව ම සැකසෙනු ඇත.

(iv) විනිමය අනුපාතවල සෘණාත්මක වෙනස්වීමක් නිසා විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මඟින් සුරක්ෂණය කර ඇති ස්මාට් මනී පහසුකමෙහි අයිරා ශේෂය නියමිත සීමාව ඉක්මවා යයි නම්, එවැනි අතිරික්තයක් සම්බන්ධව දැන්වීමක් ලැබුණු පසු අතිරික්තය වහාම ගෙවීමට හෝ එම අතිරික්තය ආවරණය කිරීමට ප්‍රමාණවත් තැන්පතු සැපයීමට හෝ ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් භාරගනියි.

19. **ස්මාට් මනී පහසුකම යටතේ ණය සඳහා පමණක් අදාළ වේ.**

(i) ස්මාට් මනී පහසුකම යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් පැහැර හැරීමේ අවස්ථාවන් පහත පරිදි දැක්විය හැකියඃ

(අ) බැංකුව විසින් නිශ්චය කරන පරිදි මූලික මුදල හෝ පොලියෙහි මාසික ආපසු ගෙවීම්වලින් කිසිවක් හෝ යම් මාසයක් සඳහා හිඟව ඇති වාරිකයක් නොගෙවීම,

සහ/හෝ

(ආ) බංකොලොත් භාවය/ වස්තු භංගත්වය,

(ii) බැංකුවට සිය අභිමතය පරිදි, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) සහ/හෝ දේශීය හෝ විදේශීය වෙනත් යම් ණය තොරතුරු කාර්යාංශයකට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ගේ ණය පැවැත්ම සම්බන්ධයෙන් වාර්තා කිරීමට අයිතිය පවතින බවට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් මෙමඟින් කැමැත්ත පළකර, පිළිගෙන සිටියි. මේ යටතේ පවතින යම් අයිතියක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමේ දී (සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන්) බැංකුව වෙතින් සිදුවන ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් එවැනි අයිතියක් හෝ ප්‍රතිකර්මයක් අතහැරීමක් ලෙස අර්ථනිරූපනය නොකළ යුතුය.

(iii) ණය වාරිකය සෑම මසක ම නියමකර ඇති දිනට ගෙවිය යුතු වන අතර, අයදුම්පතෙහි දක්වා ඇති ණය ආපසු ගෙවීමේ ගිණුමෙන් නියමිත දිනට ණය වාරිකය හර කිරීමට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් බැංකුව වෙත අවසර දී සිටියි.

(iv) එම දිනයේ දී නිශ්කාෂණය වූ මුදල් ලබාගැනීමට නොපවතී නම්, ගිණුමට කෙරෙන යම් බැරකිරීමක් හිඟ වාරිකය / වාරික සඳහා සහ පැහැර හැරීමේ පොලිය සඳහා යෙදවීම සිදුවනු

ඇති අතර, එය ඊළඟ මාසයේ නියමිත දිනයේ දී හෝ එම හිඟව පවතින වාරිකය / වාරික ආවරණය කිරීමට ප්‍රමාණවත් අරමුදල් පවතින අවස්ථාවක දී හෝ අයකර ගැනෙනු ඇත. හිඟ වාරිකය / වාරික සහ පොලී සඳහා නියමිත පොලී අනුපාත අදාළ වේ.

20. හිඟව පවතින පහසුකම් කිහිපයක් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ට ඇති විට ඔහුගේ ඉතුරුම් / ජංගම ගිණුම්වලින් කිසිවකට බැර කරන ලද කිසියම් මුදලක් බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි අවශ්‍ය යැයි සලකන ආකාරයකට අයකර ගැනීමට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන්ට මෙමගින් බැංකුව වෙත අවසර දී සිටින අතර, එවැනි අයකරගැනීමක් සම්බන්ධව හබ කිරීමට ණය ගැණුම්කරුවා විසින් කිසිදු අයැදීමක් නොකළ යුතුය.

21. සැකසුම් ගාස්තු, නියමිත කාලයට පෙර ආපසු ගෙවීමේ ගාස්තු, එකවර ගෙවනු ලබන මුදල් ප්‍රමාණ සඳහා අයකිරීම් සහ හඳුන්වා දෙනු ඇති හෝ කලින් කලට සංශෝධනය කෙරෙනු ඇති වෙනත් යම් ගාස්තු හා අයකිරීම් ණය ගැණුම්කරු /ගැණුම්කරුවන්ගේ ගිණුමෙන් හර කෙරෙනු ඇති අතර, ඒවා ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇති අතර, බැංකුවෙහි ගාස්තු ලේඛනයේ විශේෂිතව දැක්වෙනු ඇත. නියමිත කාලයට පෙර ආපසු ගෙවීම් / අර්ධ වශයෙන් ගෙවීම් කලින් කලට බැංකුව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇති ගාස්තුවක් මත භාර ගැනෙනු ඇත.

22. යම් විශේෂ හේතුවක් නොදක්වා යම් ණය අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනු ඇත.

23. මෙම නීතිරීති හා කොන්දේසි සම්බන්ධයෙන් මෙම නීතිරීති හා කොන්දේසිවලට යමක් එකතු කිරීමට, වෙනස් කිරීමට හා ඉවත් කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි. මෙම නීතිරීති හා කොන්දේසිවල එවැනි වෙනස් කිරීමක් ලිපියක් මගින්, ප්‍රකාශන පණිවුඩයක් මගින් හෝ ශාඛාවල දැන්වීම් පුවරුවේ සහ/හෝ බැංකුවේ වෙබ් අඩවිය වන www.hsbc.lk හි එය ප්‍රදර්ශනය කිරීම මගින් ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් වෙත දැනුම් දෙනු ඇත.

24. මෙම නීතිරීති ශ්‍රී ලංකාවෙහි අදාළ අවස්ථාවේ බලාත්මකව පවතින නීති මගින් පාලනය වන අතර, ඊට අනුකූලව අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, නඩු කටයුතු ශ්‍රී ලංකාවේ අධිකරණවල සිදුකෙරෙනු ඇති අතර, බැංකුව විසින් සුදුසු යැයි සිතන පරිදි වෙනත් යම් රටක හෝ බලප්‍රදේශයක හෝ නඩු පැවරීමට බැංකුව විසින් කැමති වන්නේ නම්, එවැනි අවස්ථාවක දී එම අධිකරණවලට අදාළ වන නීති අදාළ වනු ඇති අතර, එවැනි වෙනත්

අධිකරණවලට සහ වෙනත් නීතිවලට යටත් වීමට ණය ගැණුම්කරු / ගැණුම්කරුවන් එකඟ වේ.

මෙකී නීතිරීති සහ කොන්දේසි සම්බන්ධයෙන් සිංහල සහ දමිළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්වෙන බවට ගනුදෙනුකරු තහවුරුකර එකඟවෙයි.

## ප්‍රකාශනය

බැංකුව විසින් අයිරා හෝ වාරික ණය මුදලක ස්මාට් මනී පහසුකමක් මා / අප වෙත පිරිනැමීම හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම සලකා බලා,

01. මාගේ / අපගේ පාර්ශ්වයෙන් යම් වැඩිදුර අනුමත කිරීමක් අවශ්‍යවීමකින් තොරව, ස්මාට් මනී පහසුකම යටතේ මාගේ / අපගේ ඉල්ලීම මත සම්බන්ධ කර ඇති අනාගතයේ මා / අප විසින් විවෘත කරන කාල තැන්පතු ගිණුම බැංකුව වෙත උකස් තබා ඇතැයි සැලකෙනු ඇත.

02. කල්පිරීමට පෙර මා / අප වෙතින් පටහැනිව උපදෙසක් බැංකුව වෙත ලැබුණහොත් හැර, පෙර හා සමාන කාලසීමාවක් සඳහා නියමිත දිනයන් හි දී තැන්පතු(ව) ස්වයංක්‍රීයව අලුත් කිරීමට මා/අප බැංකුව වෙත අවසර දී සිටිමි / සිටිමු.

03. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ නියාමන නොවන අධිකාරියක් විසින් තැන්පතු සම්බන්ධව කරන යම් අයැදීමක් බැංකුව විසින් තැන්පතු සුරක්ෂිතයක් ලෙස රඳවා සිටීමේ අත්තිකාරමෙහි ප්‍රමාණය දක්වා ද්විතීයික මට්ටමෙහි ලා සැලකෙනු ඇති බවට මම / අපි පිළිගනිමි / පිළිගනිමු.

04. ස්මාට් මනී පහසුකම ලබාගැනීමට කටයුතු සිදුකරනු ඇත්තේ අභ්‍යන්තර ණය තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව පමණක් බවට මම / අපි පිළිගනිමි / පිළිගනිමු.

05. කිසිදු හේතුවක් නොදක්වා සිය තනි අභිමතය පරිදි ස්මාට් මනී අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතිය ඇති බව මම / අපි පිළිගනිමි / පිළිගනිමු.

06. පහසුකම වෙනුවෙන් තබා ඇති මාගේ / අපගේ සියලු කාල තැන්පතු(ව) කල්පිරීමේ දී ආපසු ලබාගතහොත්, කල්පිරීමට පෙර හෝ බැංකුව විසින් හිලව් කළහොත්, ස්මාට් මනී පහසුකම ස්වයංක්‍රීයව අවලංගු වන බවට මම / අපි එකඟ වෙමි / වෙමු.

07. ලබා දුන් ස්මාට් මනී පහසුකමක මත වන සමස්ත හිඟ මුදල හිලව් කිරීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් කාල තැන්පතු(ව) බැංකුව විසින් ලබාගතහොත්, විනිමය පාලන රෙගුලාසි මඟින් පාලනය වන බැංකුව විසින් ලබාගන්නා ලද කාල තැන්පතු පසු දිනක නැවත විදේශ ව්‍යවහාර මුදල් බවට හැරවීමක් බැංකුව විසින් නොකරන බවට මම / අපි පිළිගනිමි/ පිළිගනිමු.

ඉහත ලබා දී ඇති තොරතුරු සත්‍ය හා සම්පූර්ණ බව මා / අප තහවුරු කරන අතර, ලබා දී ඇති ස්මාට් මනී පහසුකම යටත් වන නීතිරීති සහ කොන්දේසි මා / අප විසින් කියවා තේරුම් ගත් බව හා 20........ ක් වූ ........................ මස ......... වැනි අද දිනැති, මා / අප විසින් තබා ඇති / තබන්නට යෙදෙන සුරක්ෂිතයෙහි නිරවද්‍යතාවය පිළිගත් බව ද  මෙයින් තහවුරු කරමි /කරමු.

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලයඃ | 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 |

**ශාඛා**

| | |
|---|---|
| බම්බලපිටිය ඃ | 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04 |
| වැල්ලවත්තඃ | 587, ගාලු පාර, කොළඹ 06 |
| නුගේගොඩ ඃ | 171, නාවල පාර, නුගේගොඩ |
| මහනුවර ඃ | 27, හරස් වීදිය, මහනුවර |
| පැලවත්ත, බත්තරමුල්ල ඃ | 418, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල |
| කුරුඳුවත්ත ඃ | 41, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07 |
| යුනියන් පෙදෙස ඃ | 163, යුනියන් පෙදෙස, කොළඹ 02 |
| වත්තල ඃ | 149, මීගමුව පාර, වත්තල |
| මීගමුව ඃ | 186, කොළඹ පාර, මීගමුව |
| මොරටුව ඃ | 198, ගාලු පාර, ඉඩම, මොරටුව |
| ගාල්ල ඃ | 120/2, මාතර පාර, පෙට්ටිගලවත්ත, ගාල්ල |
| යාපනය ඃ | 145, කන්කසන්තුරෙයි පාර, යාපනය |

| | |
|---|---|
| **සීග්‍ර බැංකුකරණ මධ්‍යස්ථාන** | MAS ඉන්ටිමේට්ස් පරිශ්‍රය<br>7වැනි පටුමග, බොරුපන පාර<br>කඳවල වත්ත, රත්මලාන<br>ඔරායන් සිටි සීග්‍ර බැංකුකරණ මධ්‍යස්ථානය<br>752, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 |
| කොහුවල : | 135, දුටුගැමුණු වීදිය, කොහුවල |
| එච්ලන් චතුරස්‍රය: | මහල 3, ඒකකය 3, බටහිර කුළුණ,<br>ලෝක වෙළඳ මධ්‍යසථානය<br>කොළඹ 01 |
| නවම් මාවත: | 46/38, ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් ගොඩනැගිල්ල,<br>නවම් මාවත, කොළඹ 02 |

## පිටත පිහිටි ATM යන්ත්‍ර

ලිබර්ටි ප්ලාසා (ප්‍රේමසිරි සුපිරි වෙළඳසැල ඉදිරිපිට) | ගල්කිස්ස (ලංකා බෙල් අසල) | රාජගිරිය (මැක්ඩොනල්ඩ් පරිශ්‍රය) | කොළඹ 07, වෝඩ් පෙදෙස (වෝඩ් පෙදෙස/කින්සි පාර සංඥා එළි ආසන්නයේ)

ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මඟින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර පහත දැක්වෙන විකල්පයන්ගෙන් එකක් ඔස්සේ වහාම අප අමතන්න.

- +94 114 511 566 ඔස්සේ පාරිභෝගික විසඳුම් දුරකථන අංකය අමතන්න.
- customersolutions@hsbc.com.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට ඔබගේ ගැටළු යොමු කරන්න.
- අප වෙත ලියන්න: කළමනාකරු, පාරිභෝගික සේවා, පාරිභෝගික බැංකුකරණ හා වත්කම් කළමනාකරණ, HSBC මධ්‍යස්ථානය, අංක 525 යූනියන් පෙදෙස, කොළඹ 02.

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන් වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය, 143ඒ, වජිර පාර, කොළඹ 5.
- දුරකථන- 94 112 595 625
- ෆැක්ස්-94 112 595 624
- විද්‍යුත් තැපෑල- info@financialombudsman.lk
- වෙබ් අඩවිය- www.financialombudsman.lk

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයේ පිටපතක් ඔබට අවශ්‍ය වේ නම්, කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න. නැතිනම්, අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

**CSM201706 (S)**

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා යනු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ වන බලයලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලදී.